# ලෝක බැංකුව

## ශ්‍රී ලංකාව සඳහා මීළඟ රාජ්‍ය හවුල්කාරීත්ව ක්‍රමෝපාය (2012 - 2016)
## පිළිබඳ
## මහජන අදහස් විමසීම සහ සංවාදයක් ඇති කිරීම සඳහා කරන කැඳවුම

ශ්‍රී ලංකාව සඳහා නුදුරේදී ඇතිකිරීමට සූදානම් වන රාජ්‍ය හවුල්කාරීත්ව ක්‍රමෝපාය (CPS) පිළිබඳ උපදේශාත්මක සංවාදයකට සහභාගීවීම සඳහා ස්වාධීන පුද්ගලයන්, රාජ්‍ය සංවිධාන, සහ වාණිජ ආයතන ඇතුළු සියලු මහජනතාව වෙත ලෝක බැංකුව ආරාධනය කරයි.

ලෝක බැංකුව දායකත්වය දරන එක් එක් රටක් සඳහා සෑම වසර 3 - 4 කට වරක් ලෝක බැංකුව විසින් අදාළ රට සඳහා රාජ්‍ය හවුල්කාරීත්ව ක්‍රමෝපායක් පිළියෙල කරනු ලැබේ. ශ්‍රී ලංකාව සඳහා දැනට ක්‍රියාත්මක වන ක්‍රමෝපාය 2012 ජූනි මාසය දක්වා වලංගු වේ. එබැවින් අප ශ්‍රී ලංකාව සඳහා මීළඟ රාජ්‍ය හවුල්කාරීත්ව ක්‍රමෝපාය පිළියෙල කිරීමේ කටයුත්ත සඳහා මුලපුරා ඇත්තෙමු.

රාජ්‍ය හවුල්කාරීත්ව ක්‍රමෝපායෙහි අරමුණ වනුයේ ඉදිරි වසර 4 (2012-2016) සඳහා ලෝක බැංකුව විසින් ලබාදීමට අපේක්ෂිත උපකාරයන් හි ස්වභාවය, ක්‍රමෝපාය ඒවා ලබාදීමට අරමුණු මෙන්ම ඒ සඳහා පසුබිම් වන හේතු හඳුනාගැනීමට ය. මෙම ලේඛනය පිළියෙල කරනුයේ ශ්‍රී ලංකා රජය සහ පොදු ජනතාව, සිවිල් සමාජ සංවිධාන, පෞද්ගලික අංශය සහ රටෙහි සංවර්ධනය සඳහා දායකවන අනෙකුත් පාර්ශව ඇතුළු අනෙකුත් වැදගත් පාර්ශවකරුවන් සමඟ ඉතා දැඩි සංවාදයක යෙදීමෙන් අනතුරුවය. මෙමගින් දැක්ම සංසන්දනාත්මක වාසි සහිත තෝරාගත් ක්ෂේත්‍රයන්හි (රජයෙහි ඉදිරි දැක්ම තුළින් හඳුනාගනු ලැබූ) අපේක්ෂිත ප්‍රතිඵල අත්පත් කරගැනීම සඳහා ශ්‍රී ලංකා රජය වෙත උපකාර කිරීමට ලෝක බැංකු සමූහයට දැක්විය හැකි උපරිම දායකත්වය පිළිබඳ හඳුනාගැනීමට උත්සාහ දරනු ලැබේ.

**ලියාපදිංචිවීම:**

මෙම සාකච්ඡාවන් සඳහා සහභාගීවීමට උනන්දුවක් දක්වන්නේ නම් ඒ පිළිබඳ ඔබ උනන්දුවීමට හේතු දැක්වූ (වචන 150 කට නොවැඩි) ප්‍රකාශයක් මේ සඳහා අදාළ අයදුම්පත්‍රය සමඟ (අපගේ www.worldbank.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැකි) අප වෙත කරුණාකර ලැබීමට සලස්වන්න.

**ලිපි මගින්**

**රාජ්‍ය හවුල්කාරීත්ව ක්‍රමෝපාය පිළිබඳ සංවාදය**
**හජීස් සයිනුඩීන් බාරේ,**
**ලෝක බැංකුව,**
**73/5, ගාලු පාර,**
**කොළඹ - 03, ශ්‍රී ලංකාව.**

**හෝ**

**විද්‍යුත් තැපැල : lkcps1216@worldbank.org**
**ෆැක්ස් : 2440357 / 5561352**

ආසන සීමාසහිත බැවින් පළමුව තම සහභාගීත්වය තහවුරු කරන්නන් හට ප්‍රමුඛතාවය දෙනු ලැබේ. 2012 පෙබරවාරි මාසයේදී කොළඹ, මහනුවර, මාතර, යාපනය සහ මඩකලපුව යන ප්‍රදේශයන්හිදී ( සහභාගීවන පුද්ගලයන් සංඛ්‍යාව අනුව) මහජන සංවාද පැවැත්වීමට බලාපොරොත්තු වෙමු. ලියාපදිංචිවූවන් හට ලිපි මඟින් හෝ ඊ - මේල් මඟින් දැනුම් දෙනු ලැබේ. කරුණාකර ඔබගේ මේ සම්බන්ධ උනන්දුව දක්වන ලද ප්‍රකාශය 2011 දෙසැම්බර් 30 වන සිකුරාදා දින හෝ ඊට පෙර අප වෙත එවන මෙන් ඉල්ලා සිටිමු.

වැඩිදුර තොරතුරු සඳහා ෆේස්බුක් හරහා සම්බන්ධ වන්න (www.facebook.com/worldbanksrilanka)